**Asian Network for Free Elections (ANFREL Foundation)**
105 Sutthisanwinichai Rd., Samsennok, Huai Khwang, Bangkok 10310, Thailand
Tel: +66 2-693-1867, +66 2-277-6678 / Fax: +66 2-694-3228
*Email: anfrel@anfrel.org / Website: www.anfrel.org*

**නිදහස් මැතිවරණයක් සඳහා වූ ආසියානු මැතිවරණ ජාලය ප්‍රජාතාන්ත්‍රික මූලධර්ම ක්‍රියාත්මක කරවීමේ අරමුණින්, එළබෙන ජනාධිපතිවරණයේදී ජාත්‍යන්තර මැතිවරණ නිරීක්කෂකයන් දිවයිනට**

ප්‍රවෘත්ති නිවේදනය

කොළඹ, ශ්‍රී ලංකාව

2019 ඔක්තෝම්බර් 23වනදා

2019දී පැවැත්වීමට නියමිත ශ්‍රී ලංකා ජනාධිපතිවරණය සඳහා සිය ජාත්‍යන්තර මැතිවරණ නිරීක්ෂණ මෙහෙයුම ක්‍රියාත්මක කිරීමට සියල්ල සූදානම් බව නිදහස් මැතිවරණයක් සඳහා වන ආසියානු ජාලය (ANFREL) සතුටින් යුතුව දැනුම්දෙයි. අප සංවිධානය 2001 වසරේ සිට ශ්‍රී ලංකාවේ මැතිවරණ නිරීක්ෂණ මෙහෙයුම් 10කට සම්බන්ධ වී ඇති අතර, මෙවර මැතිවරණයේ දී, රටවල් 16ක් නියෝජනය කරන ප්‍රවීණ මැතිවරණ නිරීක්ෂකයන්ගෙන් මෙම කණ්ඩායම සමන්විතය. ඔවුන් ඔක්තෝම්බර් 23වනදා සිට දිවයිනට පැමිණීමට නියමිතය. මැතිවරණ නිරීක්ෂණ බල ප්‍රදේශවලට අනුයක්ත කිරීමට පෙර, ඔවුන් සඳහා අවශ්‍ය මූලික දැනුවත් විම කොළඹ දී ලැබෙනු ඇත.

පිලිපීනයේ Damaso Magbual මහතා මෙම දූත පිරිසේ නායකත්වය දරනු ඇති අතර, ලොව වටා සිටින ප්‍රවීණ මැතිවරණ නිරීක්ෂකයන්ගෙන් මෙම කණ්ඩායම සමන්විතය. මැතිවරණ විශ්ලේෂකයන් 2ක් ඇතුළුව ප්‍රරධානින් 4 ක් , දිගු කාලීන නිරීක්ෂකයන් 9ක් සහ කෙටි කාලීන නිරීක්ෂකයන් 28කගේ සහභාගීත්වයෙන් යුත් මෙම කණ්ඩායම මැතිවරණ බල ප්‍රදේශ සියල්ල ආවරණය වන පරිදි ප්‍රජාතාන්ත්‍රික මූලධර්මයන් සහ යහපත් මැතිවරණ ක්‍රියාවලියක් තහවුරු කරනු පිනිස මැතිවරණ පාර්ශවකරුවන් සමග එක්ව කටයුතු කිරීමට අපේක්ෂිතය.

ANFREL සංවිධානය 2019 මැතිවරණය කටයුතු නිරීක්ෂණය සඳහා ශ්‍රී ලංකා මැතිවරණ කොමසාරිස් කාර්යාලයේ අනුමැතිය ලද එකම ආසියාතික රාජ්‍ය නොවන සංවිධානය වේ. මැතිවරණ නිරීක්ෂණ ක්‍රියාවලිය ANFREL සංවිධානයේ මග පෙන්වීම හා මැතිවරණ නිරීක්ෂණය සඳහා වන ජාත්‍යන්තර මූලධර්ම ප්‍රකාශයට සහ චර්යා ධර්ම සංග්‍රහයට අනුකූලව සිදුවණු ඇත

මැතිවරණ ක්‍රියාවලියේ විශ්වාසනීයත්වය සහ විනිවිදභාවය වැඩිදියුණු කිරීමත්, ජාත්‍යන්තරය පිළිගත් ප්‍රජාතාන්ත්‍රික මූලධර්ම හඳුන්වාදීමත් මගින් ශ්‍රී ලංකාව තුළ ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කිරීම ANFREL සංවිධානයේ අපේක්ෂාවයි. එම අරමුණුවලට සහය දැක්වීම සඳහා දායක වන ANFRELහි මැතිවරණ නිරීක්ෂක කණ්ඩායමෙන් බහුතරයක් නිදහස් ප්‍රජාතන්ත්‍රවාදය සහ මානව හිමිකම් කේන්ද්‍ර කරගත් ආසියාතික සංවිධාන නියෝජනය කරති.අධීක්ෂන ක්‍රියාවලිය සඳහා බැංකොක්හි නිදහස් හා සාධාරණ මැතිවරණ

සඳහා වන ප්‍රඥප්තිය සහ ප්‍රජාතන්ත්‍රවාදී මැතිවරණ පිළිබඳ Dili දර්ශක වැනි ආසියාතික ප්‍රජාතාන්ත්‍රික වටිනාකම් ඉස්මතු කෙරෙන දර්ශක උපයෝගී කර ගනු ඇත.

*මෙම මැදිහත් වීම මගින් ජනතා පරමාධිපත්‍ය තහවුරු කරන, මානව හිමිකම් ආරක්ෂා වන සාධාරණ මැතිවරණ වාතාවරණයක් ඇති කිරීම ANFREL සංවිධානයේ අපේක්ෂාවයි. මැතිවරණ නිරීක්ෂකයන්ගේ මැදිහත් වීම සමස්ත මැතිවරණ ක්‍රියාවලියේ විනිවිදභාවය තහවුරු කරනු ඇති බවත්, මහජනතාවට ප්‍රවේශ වීමට ඇති අවස්ථාව වැඩි දියුණු කරනු ඇති බවත් capacity building විශ්වාස කරයි. ශ්‍රී ලංකා මැතිවරණ කොමසාරිස් කාර්යාලය, දේශීය සිවිල් සමාජ සංවිධාන, සෙසු මැතිවරණ පාර්ශවකරුවන් සහ සමස්ත ශ්‍රී ලාංකීය ජනතාව සමග අත් වැල් බැඳගෙන මෙම ඵලදායී ක්‍රියාවලියට දායක වීමට මෙම දූත පිරිස අපේක්ෂාවෙන් සිටී.*

*###*

*Formed in November 1997, the Asian Network for Free Elections (ANFREL) has established itself as the preeminent regional NGO in Asia working on elections and democracy promotion. ANFREL focuses on Election observation as well as capacity building and development for national civil society organizations and election management bodies*

*that are actively working on democratization in their home countries. Since its formation, ANFREL has operated 65 elections since its establishment in 17 countries across Asia. Our long-term aim is to build expertise on elections and governance in the region, entrenching a culture of democracy that is seen as locally developed rather than externally imposed. Through observing elections in other countries, our observers have developed a strong understanding of international best practices – knowledge that can then be applied in their respective home countries. For more about us see www.anfrel.org.*

වැඩිදුර තොරතුරු සඳහා පිවිසෙන්න: www.anfrel.org.

අමතන්න:

චාන්දනී වටවල, මෙහෙයුම් අධ්‍යක්ෂ, chandanie@anfrel.org, +66631753221 (WhatsApp), +94767514628 (දුරකථන)

karel Jiaan Galang, මෙහෙයුම් සම්බන්ධීකාරක, karel@anfrel.org, +66620288690 (WhatsApp), +94762338361 (දුරකථන)

**Asian Network for Free Elections (ANFREL Foundation)**
105 Sutthisanwinichai Rd., Samsennok, Huai Khwang, Bangkok 10310, Thailand
Tel: +66 2-693-1867, +66 2-277-6678 / Fax: +66 2-694-3228
*Email: anfrel@anfrel.org / Website: www.anfrel.org*